# බතල වගාව

උද්භිද විද්‍යාත්මකව Ipomoea batatas ලෙස හඳුන්වන බතල අයත් වනුයේ Convolvulaceae කුලයටයි. පහතරට තෙත් කලාපය තුල පහසුවෙන් වගා කල හැකි උණුසුම් දේශගුණික තත්ත්ව ප්‍රිය කරන ලෝකයේ ඇති ආහාර හිගයට කදිම විසදුමක් සපයන අල වර්ගයකි.



## බතල වල පෝෂණ ගුණය

පිෂ්ඨය බහුල ආහාරයක් වන බතල වැඩි ප්‍රතිශතයක් අඩංගු වන්නේ ජලයයි. ප්‍රෝටීන, මේදය, ඛණිජ, විටමින් බහුල වන අතර වැඩි දල තන්තු ප්‍රමානයක් අඩංගු වීම මෙහි වැදගත් ලක්ෂණයයි. ප්‍රතිඔක්සිකාරක සංයෝග බහුල බැවින් පිලිකා වැනි බෝනොවන රෝග වැලැක්වීමේ විශේෂ හැකියාවක් සහිතයි. මෙම පෝෂක බහුලව ඇති පොත්ත ඉවත් නොකර ආහාරයට ගැනීම වැදගත් කරුණකි.

### පස

මනාව ලැබෙන හිරු එළිය ඇති, හොදින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය බහුල වැලි සහිත ලෝම පස වඩාත් සුදුසුය.

### පරතරය හා දඬු සිටුවීම

අඩියක් පමණ ගැඹුරට පස පෙරලා සකසාගත් වැටි, කදු ආකාරයේ පාත්ති මත පේලි අතර සෙ.මී. 90 ක් හා පේලියේ පැල අතර සෙ.මී. 25 ක් වන පරිදි තිරස් අතට ගැට 3 - 4ක් යටවන පරිදි දඬු සිටුවයි. සිටුවීමට පෙර පාත්තියට හොදින් කාබනික පොහොර මිශ්‍ර කලයුතු අතර සති 2 දී හා 6 දී නැවත පොහොර එක්කරයි.

### වැල පෙරලීම

ප්‍රධාන මුලට අමතරව අතිරේක මුල් පස හා සම්බන්ද වීම වැලැක්වීමට දඬු සිටුවා සෑම සති 2කට වරක් වැල් පෙරලීම සිදුකරයි.

### රෝග හා පලිබෝධ

**බතල ගුල්ලා**

බතල අලයට වඩාත් හානිකර කෘමියෙකි. නියමිත අවස්ථාවේ අස්වනු නෙලීම පැරණි වගාවල අවශේෂ වගා භූමියෙන් ඉවත් කිරීම තුලින් හානිය පාලනය කරගත හැක.

මුල් කුණුවීම

කොළ කහවී වැල් වියලීයාම රෝග ලක්‍ෂණයවේග වගාවේ ජලවහනය දියුණු කිරීම ආසාදිත පැල පස් සමග වගාවෙන් ඉවත් කිරීම මගින් රෝගය පාලනය කරගත හැක.

### අස්වැන්න නෙලීම

මාස 3 1/2 - 4 අස්වනු නෙලීම සිදු කරන අතර ඇතැම් ප්‍රභේද අනුව මෙම කාලය වෙනස්වේ.

### හාල් මල්ලේ බතල වවමු

නාගරික තට්ටු නිවාස වලට ගැලපේ. කිලෝ ග්‍රෑම් 10 හාල් මල්ලකට මතුපිට පස්ල කොම්පෝස්ට් 2 : 1 අනුපාතයෙන් පුරවා බලත දඬු 2ක් සිටුවා තට්ටු නිවාස වල ඉහල සිට පහලට වැල් වර්ධනය වීමට සලස්වයි. දිනපතා ජලසම්පාදනය කලයුතු අතර මාස 3කින් අස්වැන්න ලබාගතහැක.

වටවල වවන්න
රට පුරා පැළකරන අදහසක්

# බණ්ඩක්කා වගාව

උද්භිද විද්‍යාත්මකව Belmoschus esculanthu ලෙස හඳුන්වන බණ්ඩක්කා අයත් වනුයේ Malvaceae කුලයටයි. ශ්‍රී ලංකාව තුල උඩරට තෙත් කලාපයේ හැර සෑම දේශගුණික කලාපයකම වගා කල හැකි වර්ෂය පුරාවටම අස්වනු ලබාදීමේ විභවයක් සහිතය. සීමිත ඉඩකඩ සහිත නාගරික ගෙවත්තේ බදුන්ගත වගාවට යෝග්‍ය බෝගයකි.



## බණ්ඩක්කා වල පෝෂණ ගුණය

ලපටි කරල් වල ප්‍රෝටීන්ල කෙදි වර්ග හා ඛණිජ පදාර්ථල කැල්සියම්ල අයඩින්, මේදය හා විටමින් වර්ග වලින් සමන්විත බෝගයකි බණ්ඩක්කා දියවැඩියාව, මානසික ආතතියල හෘද්‍ ආශිත රෝග පාලනය කිරීමේ විශේෂ හැකියාවක් සහිත බෝගයකි.

### පස

මනාව ලැබෙන හිරුඑලිය සහිත හොදින් ජලවහනය වන පසක් බෝගය සඳහා වඩාත් සුදුසු වේ.

### පරතරය සහ බීජ සිටුවීම

පේලි අතර සෙ.මී. 90ක් හා පැල අතර සෙ.මී. 60 වන පරිදි සලකුණු කරන ලද වලක බීජ 3-4 ක් දමා පැලවී දින 10කදී පමණ නිරෝගී පැල දෙකක් ඉතිරි කර වැඩි පැල ගලවා දමයි.

### පොහොර යෙදීම

සකසන ලද වලවල් වලට පැල සිටුවීමට දින දෙකකට පෙර කාබනික පොහොර පුරවන ලද පොල්කටු දෙකක්ද (ග්‍රෑම් 500) ල පසුව සෑම සති 3කට වරක් කාබනික පොහොර පොල්කටුවක ප්‍රමාණයක්ද පසට එකතු කරයි.

### නිර්දේශිත ප්‍රභේද

**හරිත** - පත්‍ර විචිත්‍ර වෛරස් රෝගයට ඔරොත්තු දෙන ශාකය සහ කරල සාපේක්ෂව තරමක් කුඩා වර්ගයකි.

**එම් අයි 5** - කරල හා ගස හරිත ප්‍රභේදයට සාපේක්ෂව තරමක් විශාල අතර පත්‍ර විචිත්‍ර වෛරස් රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේදයකි.

### රෝග හා පලිබෝධ

**පත්‍ර විචිත්‍ර වෛරස් රෝගය** - බණ්ඩක්කා වගාවට බහුලවම හානි කරනු ලබන රෝගයකි. බෝගයේ මුල් අවධියේදී ආසාදනය වූවිට අස්වැන්න 80 කින් පමණ අඩු වී වගාව සම්පූර්ණවම විනාශ විය හැක. කුඩිත්තා, සුදු මැස්සා, කීඩෑවන් වැනි වාහකයන් මගින් රෝගය ව්‍යාප්තවේ.

ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම සහ සෑම දිනක්ම වගාව පරීක්ෂා කර ආසාදිත ශාක ගලවා විනාශ කිරීමෙන් රෝගය පැතිරීම පාලනය කල හැක.

### අස්වැන්න නෙලීම

සිටුවා දින 50-100 ත් අතර අස්වනු නෙලීම සිදු කරයි. කරල් ඉක්මනින් මෝරන බැවින් දිනක් හැර දිනක් හැකිතාක් උදෑසන කාලයේදී අස්වනු නෙලීම සිදු කරන්න.

වටවල වවන්න
රට පුරා පැළකරන අදහසක්

# වැටකොලු වගාව

උද්භිද විද්‍යාත්මකව Luffa acutangul ලෙස හදුන්වන වැටකොලු අයත් වනුයේ Cucurbitaceae කුලයටයි පහතරට තෙත් හා වියළිකලාපීය දේශගුණික කලාපවල පහසුවෙන් වගා කල හැකි උණුසුම් දේශගුණික තත්ත්ව ප්‍රිය කරන භෝගයකි. අධික තෙතමන තත්ත්වයන්ට භෝගය සංවේදී බැවින් තද වර්ෂා කාලය මග හැර වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් හා දිලීර රෝග වල බලපෑමෙන්ද වගාව ආරක්ෂා කර ගත හැක.



## වැටකොලු වල පෝෂණ ගුණය

ප්‍රතිඔක්සිකාරක ඛණිජ විටමින් ඒ, සී, බී 5, දල තන්තු අඩංගු අතර මලබද්දය වැලැක්වීම, ප්‍රතිශක්තිකරණ ගුණය, පිත සමනය කිරීම වැනි ගුණාංග වලින් යුතු එළවලුවකි.

### පස

මනාව ලැබෙන හිරැ එළිය ඇති හොදින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය බහුල පස වඩාත් සුදුසුය. වගාව සඳහා තෝරාගත් භූමිය තුල අනවශ්‍යය ලෙස ජලය රදා පැවැත්ම වැලැක්වීමට ගැඹුරු කාණු සැකසීම වැදගත් වේ.

### පරතරය සහ බීජ සිටුවීම

පේලි අතර මීටර් 1.5 ක් හා පේලියේ පැල අතර මීටර් 1.5 ක් වන පරිදි සලකුණු කරන ලද වලක තරමක පරතරයක් සහිතව බීජ 3-4 ක් දමා පැලවී දින 14 කදී පමණ නිරෝගී පැල දෙකක් ඉතිරි කර ඉතිරි පැල ගලවා දමයි. බීජාවරණය ඝනකමින් වැඩි බැවින් සිටුවීමට පෙර පැය 12ක් පමණ ජලයේ පෙඟවීමෙන් ප්‍රරෝහණය ඉක්මන් වේ.

### වැල පුහුණු කිරීම

බීජ සිටුවා සති 3කදී පමණ සෑම වැලක්ම මීටර් 2ක් උස පන්දලමක් වෙත යොමු කර යුතුය. ගෙවතු වගාවේදී ඉපලකට වුවද වැල යොමු කිරීම සෑහේ. වැල පාමුල කොටසින් පන්දලමට පෙර හටගන්නා අංකුර කපා ඉවත් කල යුතුය.

### නිර්දේශිත ප්‍රභේද

| | |
|---|---|
| **එල්. ඒ. 33** | අදුරු තද කොල පැහැති දිගැටි කරල් හට ගන්නා ප්‍රභේදයකි |
| **ගන්නොරුව ආරී** | කරල් දිගැටි ලා කොල පැහැයට හුරු වැඩි අස්වැන්නක් ලබා දෙන ප්‍රභේදයකි |

### පොහොර යෙදීම

සකසන ලද වලවල් වලට පැල සිටුවීමට දින දෙකකට පෙර හොදින් දිරා පත් වු කාබනික පොහොර පුරවන ලද පොල්කටු දෙකක් දමා හොදින් මිශ්‍ර කර පසුව සෑම සති 4 කට වරක් කාබනික පොහොර පොල්කටුවක පුමාණයක් පසට එකතු කරයි

### රෝග හා පළිබෝධ

**ඉල් මැස්සාගේ හානිය**

කුකර්බිටේසි කුලයේ එළවලු බෝග වල බහුලවම දක්නට ඇති හානියකි. කරලේ ඕනෑම අවස්ථාවකදී ඇතිවිය හැක. කුඩා කරල් වල ඉල් මැස්සාගේ සුහුඹුල් සතා දමන බිත්තර වල කීට අවදිය කරලේ හානියට හේතුවේ. එම නිසා මුලු කරලම කුඩා අවධියේදී වසුන් මගින් ආවරණය කිරීම කල යුතුය.
ඉල් මැස්සාගේ පිලා අවධිය පස තුල ගත කරන බැවින් කුණු වු කරල් ඉදුනු කරල් වගාවෙන් ඉවත් කර විනාශ කිරීමෙන් හානිය පාලනය කල හැක.

**යටි පුස්/පිටි පුස් රෝගය**

අධික ආර්ද්‍රතාවය සහිත පරිසර තත්ත්ව වලදී රෝගය පැතිරීම වේගවත් වේ. එමනිසා අධික වර්ෂාව සහිත කාලගුණික තත්ත්ව මග හැර වගා කිරීම, පැල අතර නිසි පරතරය තබා ගැනිම හා වගාවට හොදින් හිරු එලිය ලැබීමට සැලැසැවීම මගින් රෝගය පැතිරීම පාලනය කර ගත හැක.

### අස්වැන්න නෙලීම

මේරීමට පෙර ඉක්මනින්ම කරල නෙලා ගත යුතු අතර පළමු අස්වැන්න සිටුවා දින 60-75 අතරදී නෙලා ගත හැක. පසුව සෑම දින 4 කට වරක් පමණ අසවනු වාර 10-15ක් නෙලා ගත හැක.

ගොවින් විසින් නිෂ්පාදනය කරනු ලබන එළවළු දුර බැහැර ප්‍රදේශ වල සිටින පාරිභෝගිකයින් අතට පත්වන විට, ඒවායේ ගුණාත්මය විශාල ලෙස පහළ යාම අප රටේ බහුල වශයෙන් සිදුවන දෙයකි.

විශාල වශයෙන් සිදුවන පසු අස්වනු හානි වලට ප්‍රධාන වශයෙන් හේතුවන සාධක කීපයකි. ප්‍රවාහනයේදී හා වෙළඳ සැලේදී ජලය පිටවීම නිසා බර අඩුවීම, මේරීම, තැලීම් හා සීරීම් සිදුවීම, ලෙඩ රෝග, කුණුවීම යනාදිය මේ අතරින් ප්‍රධාන තැනක් ගනී.

එබැවින් ගෙවතු වගාව තුලින් නැවුම් එළවලු හා පළතුරු ආහාර සඳහා එක්කර ගත හැක. තවද ආහාර සඳහා වැයවන මුදල් ඉතුරු වීම, මානසික සතුට හා වින්දනය ලැබිම. පවුලේ එකමුතු බව වැඩවීමද සිදුවේ.

## ගෙවත්තේ වගා කළහැකි බෝග

| | |
|---|---|
| හොදින් හිරු එළිය ඇති ස්ථාන සඳහා | මිරිස්, මාලු මිරිස්, බණ්ඩක්කා, කරවිල වැනි එළවලු බෝග ආදිය |
| දිය සිරාව ඇති තැන් සඳහා | නිරමුල්ලිය, කංකුන්, කොහිල, මුකනුවැන්න |
| සෙවන සහිත ස්ථාන සඳහා | ඉගුරු, කහ, කිරි අල, කොච්චි |
| වැටවල් සහිත ස්ථාන සඳහා | කතුරුමුරුංගා, මුරුංගා, ෆැෂන්ෆෘට් |

## බෝග සිටුවන ආකාරය

| | |
|---|---|
| බීජ ලෙස සිටුවන බෝග | බණ්ඩක්කා, මැකරල්, කරවිල, වැටකොලු, පතෝල, දඹල |
| තවාන් දමා පැල සිටුවීම | බටු, වම්බටු, මිරිස්, තක්කාලි, මාලු මිරිස්, ගෝවා |
| දඬු කැබලි මගින් වගාකල හැකි බෝග | බතල, මඤ්ඤොක්කා, කංකුන්, නිවිති මුකුණුවැන්න, |
| අල කැබලි මගින් සිටුවිය හැකි බෝග | කිරි අල, වැල් අල, ඉගුරු, කහ |

## ගෙවත්ත සඳහා සුදුසු පරිසරය

වගාව සඳහා සරු, සැහැල්ලු පසක් තිබීම
මල් පෝච්ච, වගා මලු, පොලිසැක් උර, වගා කුළුණු වගාව සඳහා යොදාගැනීම



## වගාව සඳහා කාබනික පොහොර නිෂ්පාදනය

(මාලු දියර පොහොර)
පෑට් ටොනික් (පළතුරු දියර පොහොර)

### ගොඩ ක්‍රමය

පහසුවෙන් දිරායන ගෙවත්තෙන් ඉවතලන ශාක පත්‍ර හා අමු ගොම/ කුකුල් පොහොර තට්ටු වශයෙන් තැන්පත් කර කලු පැහැති ඉටි කොළයකින් වසා තබන්න. සති 4, 8, හා 10 න් පෙරලීමට ලක්කර තෙතමය පරීක්ෂා කර අවශ්‍ය පරිදි ජලය එක්කිරීම කර සති 12කින් කොම්පොස්ට් ලබාගත හැක.

### බැරල් ක්‍රමය

පහසුවෙන් දිරායන ගෙවත්තෙන් හා මුලුතැන්ගෙයින් ඉවත ලන ශාක කොටස් ඇතලට වාතාශ්‍රය ලැබෙන ලෙස සිදුරු සාදන ලද ප්ලාස්ටික් හෝ කොන්ක්‍රීට් පියනක් සහිත බැරලයකට එකතුකර පීරනයට ලක්කරයි. බැරලයේ යට කොම්පොස්ට ලබාගත හැකිවන ලෙස සකසාගත් කවුලුවක් තිබිය යුතුය. දිග ලියකින් වරන් වර කවලම් කලයුතු අතර තෙතමනය පරික්ෂාකර ජලය එක්කිරීම කලයුතුය. මාස 3කින් පමණ කොම්පොස්ට් ලබාගත හැක.



# දඹල වගාව

උද්භිත විද්‍යාත්මකව Psophocarpus tetragonolobu ලෙස හදුන්වන දඹල අයත් වනයේ Fabaceae කුලයටයි. පහතරට හා මැදරට තෙත් හා වියළි කාලගුණයක් සහිත ප්‍රදේශවල පහසුවෙන් වගා කල හැකි බෝගයකි. කෘමි ප්‍රතිරෝධී හා රෝග සදහා හොදින් ඔරොත්තු දීමේ හැකියාවක් පවතින බැවින් ගෙවතු වගාව සදහා ඉතාමත් යෝග්‍ය බෝගයකි.



## දඹල වල පෝෂණ ගුණය

ප්‍රෝටීන්, විටමින් සී සහ දල තන්තු වර්ග වලින් සමන්විත එළවළුවකි. ලපටි කොළ හා දලු මැල්ලුමක් ලෙස අහාරයට ගතහැකි කොළ එළවලුවකි. ශරීරයේ බර අඩුවීමල ඇස්වල පෙනීම වැඩිවීමල ප්‍රතිශක්තිය වැඩි කිරීම වැනි ගුණාංග සහිතය.

### පස

මනාව ලැබෙන හිරුඑළිය ඇති හොදින් ජලය බැස යන වැලි ලෝම පස සහ මැටි ලෝම පස වගාව සදහා වඩා සුදුසුය. නමුත් වැලි සහිත පස් වල මෙන්ම මැටි අධික පස් වලද වගා කල හැකි බෝගයකි.

### පරතරය සහ බීජ සිටුවීම

පේලි අතර සෙ.මී. 75 ක් හා පැල අතර සෙ.මී.60 වන පරිදි සලකුණු කරන ලද වලක බීජ 3 -4 ක් දමා පැල දින 10කදී පමණ නිරෝගී පැල දෙකක් ඉතිරි කර ඉතිරි පැලය ගලවා දමයි.

### වැල් පුහුණු කිරීම

සෑම වැලක්ම වැල අසලින් සිටුවා ගත් ඉපලකට හෝ අඩි 6ක් පමණ උස ආධාරක කණු වලට යොමු කරන්න.

### පොහොර යෙදීම

සකසන ලද වලවල් වලට පැල සිටුවීමට දින දෙකකට පෙර හොදින් දිරා පත් වු කාබනික පොහොර පුරවන ලද පොල්කට දෙකක් (ග්‍රෑම්500) දමා හොදින් මිශ්‍ර කර පසුව සෑම සති 4 කට වරක් කාබනික පොහොර පොල්කටුවක ප්‍රමාණයක් පසට එකතු කරයි

### නිර්දේශිත ප්‍රභේද

**ක්‍රිෂ්ණා** - සෙ.මී. 27ක් පමණ දික්වූ දම් පාට කරලක් හට ගනිග වසර පුරාම වගා කර සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකි ප්‍රභේදයකි.

**එස් එල් එස් 144** - වර්ෂය පුරාම වගා කර සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකග කරල කොළ පැහැති අතර මල් සුදු පැහැතිය. කරලක බර ග්‍රෑම් 15-20 ත් අතර වේ.

### රෝග හා පලිබෝධ

විශේෂිත වූ රෝග හා පලිබෝධ හානි නොමැති වුවද ගෙවතු වගාවේ කුරුල්ලන් විසින් ලපටි මල් කාදමන නිසා අස්වැන්න අඩු වීමට හැකි බැවින් ඒ පිලිබද අවධානය යොමු කල යුතුය.

### අස්වැන්න නෙලීම

පළමු අස්වැන්න සිටුවා දින 75 දී පමණ ලබා ගත හැක. පසුව සෑම දින 3-4 කට වරක් ලපටි කරල් අස්වැන්න සති 6-7 අතර කාලයක් දක්වා නෙලා ගත හැක.

# කරවිල වගාව

උද්භිද විද්‍යාත්මකව Momordica charanti ලෙස හදුන්වන කරවිල අයත් වනුයේ Cucurbitaceae කුලයටයි. පහතරට තෙත් හා වියළි කලාපීය දේශගුණික තත්ත්ව වලදී පහසුවෙන් වගා කළ හැක.

නමුත් බීජ පැළවීමට හා ශාක වර්ධනයට සෙල්සියස් අංශක 28 -30 අතර උෂ්ණත්වයක් පැවතීම යෝග්‍ය වේ.



## කරවිල වල පෝෂණ ගුණය

රුධිරයේ අඩංගු සීනි ප්‍රමාණය අඩු කරන රසායනික සංයෝගල ප්‍රෝටීන්ල විටමින් ඒලබීල පොස්පරස් සහ දළ තන්තු වර්ග වලින් සමන්විත දියවැඩිව පාලනය, ලේ පිරිසිදු කිරීමට, ඇස් පෙනීම දියුණු කිරීමට, අර්ශස් රෝගය පාලනයට හැකියාව සහිත එළවළුවකි.

### පස

මනාව ලැබෙන හිරු එළිය ඇති හොදින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය බහුල පස වඩාත් සුදුසුය

### පරතරය සහ බීජ සිටුවීම

පේලි අතර මී. 1.5 ක් හා පේලියේ පැල අතර මී. 1 ක් වන පරිදි සලකුණු කරන ලද වලක බීජ 3 - 4 ක් දමාල පැලවී දින 10ක දී පමණ නිරෝගී පැල දෙකක් ඉතිරි කර ඉතිරි පැල ගලවා දමයි. බීජයේ පොත්ත ඝණකම බැවින් බීජ සිටුවීමට පෙර දිනක් හොදින් පෙගවීමෙන් පැලවීම ඉක්මන් වෙයි.

### වැල පුහුණු කිරීම

බීජ සිටුවා සති 3කදී පමණ සෑම වැලක්ම මී. 2ක් උස පන්දලමක් වෙත යොමු කල යුතුය. ගෙවතු වගාවේදී ඉපලකට වුවද වැල යොමු කිරීම සෑහේ. වැල පහලින් පන්දලමට පෙර හටගන්නා පාර්ශ්වික අංකුර කපා ඉවත් කළ යුතුය.

### නිර්දේශිත ප්‍රභේද

**එම් සී 43** - මධ්‍යම ප්‍රමාණයේ ලා සුදු කොළ පැහැයට හුරු කරලකි. කරල මතුපිට දත් වැනි නෙරැම් ඇත

**තින්නවේලි සුදු** - තරමක් විශාල කරල් සුදු-කොළ පැහැ ගනී. කරල මතුපිට අඛණ්ඩව විහිදුණු දාර පවතී.

### පොහොර යෙදීම

සකසන ලද වලවල් වලට පැල සිටුවීමට දින දෙකකට පෙර හොදින් දිරා පත් වු කාබනික පොහොර පුරවන ලද පොල්කටු දෙකක් (ග්‍රෑම් 500 ) දමා හොදින් මිශ්‍ර කර පසුව සෑම සති 4 කට වරක් කාබනික පොහොර පොල්කටුවක ප්‍රමාණයක් පසට එකතු කරයි

### රෝග හා පළිබෝධ

ඉල් මැස්සාගේ හානිය විශේෂ වේ. කරලේ ඕනෑම අවස්ථාවකදී ඇතිවිය හැක. ළපටි කරල් වල ඉල් මැස්සාගේ සුහුඹුල් සතා දමන බිත්තර හානියට හේතුවේ. එම නිසා මුළු කරලම ලපටි අවධියේදී ආවරණය කිරීම කල යුතුය. ඉල් මැස්සාගේ පිළා අවධිය පස තුල ගත කරන බැවින් කුණු වු කරල් ඉදුනු කරල් වගාවෙන් ඉවත් කර විනාශ කිරීමෙන් හානිය පාලනය කල හැක.

### අස්වැන්න නෙලීම

පළමු අස්වැන්න සිටුවා දින 60-75 අතරදී ලබා ගත හැක. පසුව සෑම දින 4 කට වරක් පමණ අසවනු වාර 10-14ක් නෙලා ගත හැක.

# මාළු මිරිස් වගාව

උද්භිද විද්‍යාත්මකව Capsicum annum ලෙස හඳුන්වනු ලබන මාළු මිරිස් අයත්වනුයේ solanaceae කුලයටයි. සියලුම දේශගුණික කලාපවල වගා කල හැකිවන අතර වර්ෂය පුරාම අස්වනු ලබාදෙන බෝගයකි. අඩු ඉඩකඩ සහිත නාගරික ගෙවතු වල බදුන්ගත වගාවට ඉතාමත් ගැලපෙන බෝගයකි.



## මාළු මිරිස් වල පෝෂණ ගුණය

කැප්සිකියුටික් නම් රසායනික සංයෝගය ඇති බැවින් සැර ගතියෙන් යුක්තයග විටමින් ඒ, සී, පොස්පරස් පොටෑසියම් වැනි පෝෂක අඩංගුවේග රුධිර පීඩනය පාලනය, මොළයේ ක්‍රියාකාරීත්වය දියුණු කිරීම, අධික තරබාරුව අඩු කිරීම වැනි ගුණාංග වලින් පොහොසත් එළවළුවකි.

### පස

මනාව හිරු එළිය ලැබෙන, හොඳින් ජලය බැස යන සාරවත් ලෝම පසක් අවශ්‍ය වේ. කාබනික පොහොර අවශ්‍ය තරමට යෙදීමෙන් වැලි සහිත පස් වලද බෝගය සාර්ථකව වගා කළ හැක

### පරතරය සහ බීජ සිටුවීම

අඩියක් පමණ ගැඹුරට හොඳින් කැට පොඩි වන සේ පස පෙරළා පාත්ති සකස් කර ගනී. සකසා ගත් පාත්ති වල පේලි අතර හා පැලකර සෙන්ටි මී. 40 ක පරතරයෙන් සවස් කාලයේදී පැල සිටුවීම කරයි.

### පොහොර යෙදීම

පැල සිටුවීමට දෙදිනකට පෙර සකසා ගත් පාත්ති වලට හොඳින් දිරාපත්වූ කාබනික පොහොර ප්‍රමාණවත් පරිදි දමා මිශ්‍ර කරන්නග පසු පසුව සෑම සති හතරකට වරක් කාබනික පොහොර දෝතක් දමා පස් සමඟ මිශ්‍රකර පැළ පාමුලට පස් ලං කරන්න.

### නිර්දේශිත ප්‍රභේද

**හන්ගේරියන් යෙලෝ වැක්ස්**

කේතු ආකාර දිලිසෙන සුලු කහ පැහැති කරල ශාකයේ උඩු අතට හට ගනියි. බැක්ටීරියා හිටුමැරීම රෝගයට සංවේදී බැවින් තෙත් කලාපය සඳහා නිර්දේශ නොකරයි

**සී.ඒ.8**

ලා කොළ පැහැති කරලේ අග ඇතුලට නැවී ඇතග රැලි සහිත කරලකි.

### රෝග හා පලිබෝධ

**කොළ කොඩවීමේ වෛරස් රෝගය**

සුදු මැස්සා, පැල මැක්කා, කූඩිත්තා, වැනි වාහකයන් මගින් පැතිරේග වාහකයක් වගාවෙන් පලවා හැරීම, ආසාදිත ශාක ගලවා ඉවත් කිරීමෙන් රෝගය පැතිරීම පාලනය කළ හැක.

**දියමලන්කෑම/ හිටුමැරීම/ ඇන්ත්‍රැක්නෝස් රෝගය**

ජලය සඳහා ඉතාමත් සංවේදී බෝගයක් බැවින් වර්ෂා කාලය මගහැර වගාකිරීමෙන් වගාවේ ජල වහනය දියුණු කිරීමෙන් මෙම රෝග පැතිරීම පාලනය කළ හැක.

### අස්වැන්න නෙලීම

සිටුවා දින 70-80 අතර අස්වනු නෙලාගත හැක වැසි සහිත දිනවල අස්වනු නෙලීම සිදු නොකරයි අස්වනු වාර අටත් දහයත් අතර නෙලාගත හැක.

වටවල වවන්න
ඔබේ රට පුරා පැළකරන අදහසක්

# මිරිස් වගාව

උද්භිද විද්‍යාත්මකව Capsicum annum ලෙස හඳුන්වන මිරිස් අයත්වනුයේ solanaceae කුලයටයි තෙත් හා වියළි දේශගුණික කලාප වල වගා කළ හැක. ප්‍රශස්ත උෂ්ණත්ව පරාසය සෙල්සියස් අංශක 21- 27 අතර වේ අඩු ඉඩකඩ සහිත නාගරික ගෙවතු වල බදුන්ගත වගාවට ඉතාමත් ගැලපෙන බෝගයකි



## මිරිස් වල පෝෂණ ගුණය

අප හා ආහාර සැකසීමේදී අත්‍යවශ්‍ය කුළුබඩුවක් වන මිරිස් විටමින් ඒ, බී2, සී වලින් පොහොසත් වේ. ශ්වසන ක්‍රියාවලියට, රුධිර පීඩනය පාලනයට සහ හෘද සෞඛ්‍ය පාලනයට හැකියාවක් ඇති භෝගයක් වේ.

### පස

හොඳින් හිරු එළිය ලැබෙන, මනා ජලවහනය සහිත, කාබනික ද්‍රව්‍ය බහුල වැලි ලෝම පස ඉතාමත් සුදුසු වේ.

### පරතරය සහ බීජ සිටුවීම

හොඳින් කැට පොඩි වන සේ අඩියක් පමණ ගැඹුරට පස පෙරලා, කැට පොඩිකර පස සකස් කර පේලි අතර සෙ.මී. 60 ද පේලියේ පැල අතර සෙ.මී. 45 ක් ද වන ලෙස සලකුණු කරන ලද වලක නීරෝගී පැළ දෙක බැගින් සිටුවයි.

### නිර්දේශිත ප්‍රභේද

**MI CH 03**

හොඳින් අතු බෙදෙන පඳුරු ආකාර ගන්නා වර්ගයකි. දිගැති තද කොල පැහැති වේ. කරල් වල සැර ගතිය වැඩිය. කොළ කොඩ වීමේ රෝගයට තරමක් ප්‍රතිරෝධී අපනයන විභවයක් ඇති වර්ගයකි.

**MI CH HY 01**

පඳුරු ආකාර ගන්නා අමුමිරිස් සඳහා යෝග්‍ය කොල කොඩවීමේ වෛරසයට ප්‍රතිරෝධී දෙමුහුන් ප්‍රභේදයකි

**MI VARANIYA 1**

දේශිය වැරණියා මිරිස් වලට සමාන එයට වඩා වර්ධනය වන වැඩි අස්වනු ලබා දෙන වර්ගයකි.

### පොහොර යෙදීම

සැකසූ වලවල් වලට පැළ සිටුවීමට දින දෙකකට පෙර හොඳින් දිරාපත්වූ කාබනික පොහොර ග්‍රෑම් 500 ක්ද පැල සිටුවා සෑම සති4 කට වරක් කාබනික පොහොර ග්‍රෑම් 250 ක් පමණද එක් කරන්න.

### රෝග හා පළිබෝධ

**කොල කොඩවීම**

පැල මැක්කා, මයිටාවා, කූඩිත්තා, සුදු මැස්සා ගෙන් වගාවට පැතිරෙන දරුණු වෛරස් රෝගයකි. රෝගය පතුරවන කෘමි සතුන් වගාවෙන් පලවා හැරීම සදහා කහපාට ඇලෙන සුලු පොලිතින් උගුල් භාවිතයල කාබනික කෘමි විකර්ශක භාවිතය වැනි උපක්‍රම භාවිතා කල හැක, ආසාදිත ශාක ගලවා විනාශ කිරීම මගින් රෝගය පැතිරීම පාලනය කළ හැක.

### අස්වැන්න නෙලීම

සිටුවා දින 70 - 80 අතර පළමු අස්වැන්න ද එතැන් සිට සෑම දින හතරකට වරක් ද අස්වනු නෙලා ගන්න

වටවල වවන්න
ඔබේ රට පුරා පැළකරන අදහසක්

# තක්කාලි වගාව

උද්භිද විද්‍යාත්මකව Solanum lycopersicon ලෙස හදුන්වන තක්කාලි අයත් වනුයේ solanaceae කුලයටයි ශ්‍රී ලංකාවේ උඩරට තෙත් කලාපයේ හැර සෑම දේශගුණික කලාපයකම වගා කල හැකි භෝගයකි.
සීමිත ඉඩකඩ සහිත නාගරික ගෙවත්තේ බදුන්ගත වගාවට ගැලපෙන භෝගයකි



## තක්කාලි  වල පෝෂණ ගුණය

විටමින් ඒ ,සී, ප්‍රතිඔක්සිකාරක හා ඛණිජ පදාර්ථ වලින් සමන්විතය.

### පස

මනාව ලැබෙන හිරැ එළිය  සහිත හොදින් ජලවහනය වන වැලි ලෝම පස වගාව සදහා වඩාත් සුදුසු වේ

### පරතරය සහ බීජ සිටුවීම

පේලි  අතර සෙ.මී. 80ක් හා පැල අතර සෙ.මී. 50 වන පරිදි සලකුණු කරන ලද වලක එක් පැලයක් බැගින් සිටුවීම සවස් කාලයේ සිදු කරයි.

### ගස් පුහුණු කිරීම

ශක්තිමත් කදක් නොමැති බැවින් ගස පහසුවෙන් ඇද වැටීමට හැක. එමනිසා මල් පිපීමට පෙර ගස අසල සිටුවන ලද ආධාරක කෝටු වලට ගස බැදීම කල යුතුයග

### පොහොර යෙදීම

සකසන ලද වලවල් වලට පැල සිටුවීමට දින දෙකකට පෙර කාබනික පොහොර පුරවන ලද පොල්කටු දෙකක්ද සෑම සති 3කට වරක් පොල්කටුවක පුමාණයක්ද පසට එකතු කරයි

### නිර්දේශිත ප්‍රභේද

**තිලිණ** - බැක්ටීරියා හිටු මැරීමේ රෝගයට ඔරොත්තු දේග ඉදුණු විට තැඹිලි රතු පැහැ වන ගෙඩියේ පොත්ත ඝනකම් බැවින් ගෙඩිය තැලීමට ලක් නොවේ. ගසකින් කි.ග්‍රෑම් 3-5  පමණ අස්වැන්නක් ලබා ගත හැක.

**මහේෂි** - බැක්ටීරියා හිටු මැරීමේ  රෝගයට ඹරොත්තු දෙන දෙමුහුම් ප්‍රභේදයකිග ඉදුණු විට කහ රතු පැහැයට හුරු ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 125 ට පමණ වේ.

### රෝග හා පලිබෝධ

වගාවට බහුලවම හානි වනුයේ දිලීර ආසාධන වලිනිග මෙම සෑම දිලීරයක්ම පැතිරීමට අධික වර්ෂාව සහිත කාලගුණික තත්ත්ව හේතු වන බැවින් මෙම කාලගුණික තත්ත්ව මග හැර වගා කටයුතු කිරීම රෝග මර්ධනයට වඩාත් යෝග්‍යය වේ.

### අස්වැන්න නෙලීම

සිටුවා දින 75-90 ත් අතරල එනම් ගෙඩියේ වර්ණය කොළ පැහැයේ සිට කහ පැහැය දක්වා වෙනස් වීමත් සමග අස්වනු නෙලීම සිදු කරයි. එතැන සිට සෑම දින 8-10 වරක් අස්වනු නෙලා ගත හැක
කරල් අස්වැන්න සති 6-7 අතර කාලයක් දක්වා නෙලා ගත හැක

වටවල වවන්න
තේ රට පුරා පැළකරන අදහසක්

# රාබු වගාව

උද්භිද විද්‍යාත්මකව Raphanus sativus ලස හදුන්වන රාබු අයත් වනුයේ Brassicaceae කුලයටයි ශ්‍රී ලංකාවේ සියලූම කෘෂි දේශගුණික කලාපවල හොදින් හිරු එළිය ලැබෙන තත්ත්ව යටතේ වසර පුරාම වගා කල හැකි බෝගයකි ගෙවත්තේ ඉඩකඩ සීමිත  විටදී බදුන් තුල වගා කිරීමට හැකි  වීමත්, අඩු කාලයක් තුල අස්වැන්න ලබා දීමත් නිසා ගෙවතු වගාවට හොදින් ගැලපෙන බෝගයකි



## රාබු වල පෝෂණ ගුණය

ඇස්කෝබික් අම්ලය, ෆෝලික් අම්ලය හා පොටෑසියම් බහුල එළවලූවකි. දියවැඩියාව, ආමාශගත රෝග ශරීරය සජලීයව තබාගැනීම හෘද රෝග පාලනය වැනි ගුණාංගයන්ගෙන් පොහොසත් බෝගයකි.

### පස

මනාව ලැබෙන හිරැ එළිය ඇති කාබනික ද්‍රව්‍ය බහුල හොදින් ජලය බැස යන පස වගාවට වඩාත් සුදුසුය.

### පරතරය හා රෝපණ ද්‍රව්‍ය සකස් කර ගැනීම

සෙ.මී. 30 - 40 ගැඹුරට පස පෙරලා කැට පොඩිකර උස් වූ පාත්ති සකසා ගනී. සකස් කරන ලද පාත්ති වල සෙ.මී. 25-30 පරතරයට සැකසූ පේලි වල බීජ සිටුවීම කරයිග බීජ පැලවී දින 10 කදී පමණ පැල අතර පරතරය සෙ.මී. 10 ක් වන පරිදි තබා වැඩි පැල ගැලවීම කරයි.

### නිර්දේශිත ප්‍රභේද

**ජපන් බෝල රාබු** -

සුදු පැහැති බෝල ආකාරයේ අල නිපදවයිග උඩරට හා මැද රට කලාප සදහා හොදින් ගැලපේ. දින 45-55 අතර අස්වැන්න නෙලා ගත හැක.

**බීරලූ රාබු**

සුදු පැහැති කරඩු ආකාරයේ අල නිපදවයි. පහතරට කලාප සදහා හොදින් ගැලපේ දින 45-50 අතර අස්වැන්න නෙලා ගත හැක

### පොහොර යෙදීම

සකසන ලද පාත්ති වලට (වර්ග මීටර් 1ක් පමණ) පවත බීජ සිටුවීමට දින දෙකකට පෙර හොදින් දිරා පත් වු කාබනික පොහොර පුරවන ලද පොල්කටු 6 - 8ක් දමා හොදින් මිශ්‍ර කරයි.  පසුව 3 වන සතියේදී පේලි දිගේ කාබනික පොහොර එකතුකර පස සමග මිශ්‍ර  කර පැල මුලට පස් ලං කිරීම සිදු කරයි.

### රෝග හා පළිබෝධ

වගාව දිනපතා පරික්ෂා කර පත්‍ර කනින්නාල පත්‍ර කන දළඹුවා වැනි සතුන්ගේ ආසාධනය සහිත ශාක කොටස් වගාවෙන් ඉවත් කර විනාශකල යුතුය.

### අස්වැන්න නෙලීම

අස්වනු නෙලීම පමා වීමෙන් අල මෝරා අස්වැන්නේ ගුණාත්මය අඩු වීම නිසා ප්‍රභේදය අනුව නියමිත කාලයේදී අස්වනු නෙලා ගත යුතුය.

වටවල වවන්න
තේ රට පුරා පැළකරන අදහසක්

# පිපිඤ්ඤා වගාව



උද්භිද විද්‍යාත්මකව Cucumis sativus ලෙස හඳුන්වන පිපිඤ්ඤා අයත් වනුයේ Cucurbitaceae කුලයටයි. පහත රට තෙත් හා වියළි කලාප වල ප්‍රදේශ වල පහසුවෙන් වගා කල හැකි උණුසුම් දේශගුණික තත්ත්ව ප්‍රිය කරන භෝගයකි. අධික තෙතමන තත්ත්වයන්ට බෝගය සංවේදී බැවින් තද වර්ෂා කාලය මගහැර වගා කිරීමෙන් හොඳ අස්වැන්නක් ලබා ගත හැක. සෙල්සියස් අංශක 30 ක පමණ උෂ්ණත්වය භෝගයට ඉතාම හිතකරවෙයි

## පිපිඤ්ඤා වල පෝෂණ ගුණය

දල තන්තු, විටමින් බී සහ සී වලින් සමන්විත පහසුවෙන් පිරණය වන ජල ප්‍රතිශතය වැඩි එළවලුවකි. ඉහල ප්‍රතිඔක්සිකාරක ගුණයක් තිබීම, ශරීරය සජලීකරණය කිරීම, ආහාර පීරණය පහසුකිරීම වැනි ගුණාංගවලින් සමන්විතවේ.

### පස

මනාව ලැබෙන හිරැ එළිය ඇති හොදින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය බහුල පස වඩාත් සුදුසුය. දිගු කලක් ජලය රඳා පැවතිමේ තත්ත්වයන්ට භෝගය සංවේදීවෙයි.

### පරතරය සහ බීජ සිටුවීම

පේලි අතර මීටර් 1 ක් හා පේලියේ පැල අතර මීටර් 1 ක් වන පරිදි සලකුණු කරන ලද වලක තරමක පරතරයක් සහිතව බීජ 3-4 ක් දමා පැලවී දින 14 කදී පමණ නිරෝගී පැල දෙකක් ඉතිරි කර ඉතිරි පැල ගලවා දමයි.

### වැල පුහුණු කිරීම

පැල වලට මීටර් 1 1/2 උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක ආකාරයට ලණු ඇද එයට වැල් යොමු කරන්න. වැල බිම දිගේ ඇදී යන පරිදි වර්ධනය වීමටද දිය හැක.

### නිර්දේශිත ප්‍රභේද

**එල්. වයි. 58**

කහ පාට ගෙඩියේ කලු පැහැති නෙරුම් ඇත. තරමක් විශාල ගෙඩි සිලින්ඩරාකාර හැඩයක් ගනී.

**කල්පිටිය වයිට්**

තරමක් විශාල ක්‍රීම් පැහැ ගෙඩි සිලින්ඩරාකාර හැඩයක් ගනී. මේරූ විට දුඹුරූ පැහැතිය

**ගන්නොරුව වයට්**

දෙමුහුම් ප්‍රභේදයකි. තරමක් විශාල සිලින්ඩරාකාර ගෙඩි ක්‍රීම් පැහැතිය

### පොහොර යෙදීම

සකසන ලද වලවල් වලට පැල සිටුවීමට දින දෙකකට පෙර හොදින් දිරා පත් වු කාබනික පොහොර පුරවන ලද පොල්කටු දෙකක් දමා හොදින් මිශ්‍ර කර පසුව සෑම සති 4 කට වරක් කාබනික පොහොර පොල්කටුවක පුමාණයක් පසට එකතු කරයි

### රෝග හා පළිබෝධ

**ඉල් මැස්සාගේ හානිය**

කුකර්බිටේසියේ කුලයේ එළවලූ බෝග වල බහුලවම දක්නට ඇති හානියකි. ගෙඩියේ ඕනෑම අවස්ථාවකදී ඇතිවිය හැක. කුඩා ගෙඩිවල ඉල් මැස්සාගේ සුහුඹුල් සතා දමන බිත්තර හානියට හේතුවේ. එම නිසා කුඩා අවධියේදී ආවරණය කිරීම කල යුතුය. ඉල් මැස්සාගේ පිලා අවධිය පස තුල ගත කරන බැවින් කුණු වු ගෙඩි ඉදුනු ගෙඩි වගාවෙන් ඉවත් කර විනාශ කිරීමෙන් හානිය පාලනය කල හැක.

**යටි පුස්/පිටි පුස් රෝග/ඇන්ත්‍රැක්නොස් රෝගය**

අධික ආර්ද්‍රතාවය සහිත පරිසර තත්ත්ව වලදී රෝගය පැතිරීම වේගවත් වේ. එමනිසා අධික වර්ෂාව සහිත කාලගුණික තත්ත්ව මග හැර වගා කිරීමග පැල අතර නිසි පරතරය තබා ගැනිම හා වගාවට හොදින් හිරූ එළිය ලැබීමට සැලැසැවීම මගින් රෝගය පැතිරීම පාලනය කර ගත හැක.

### අස්වැන්න නෙලීම

ගෙඩිය කහ පැහැ වු පලමු අස්වැන්න මාස දෙකකදි නෙලා ගෙන පසුව සෑම දින 4 කට වරක් පමණ අසවනු වාර 10ක පමණ නෙලා ගත හැක.

අපට අවශ්‍ය නිරෝගී එළවලූ පැල නිපදවා ගැනිම සඳහා එළවලූ පැල තවාන් සකස් කරන ප්‍රධාන ආකාර 2කි.

## තවාන් පාත්ති ක්‍රමය

නිරෝගී ගුණාත්මක එළවලූ පැල වැඩි පමාණයක් එකවර ලබා ගැනිම සඳහා වඩාත් යෝග්‍ය වේ. මේ සදහා දවස පුරා හොදින් හිරුඑළිය ලැබෙන තෝරාගත් භූමියේ වල් මර්ධනය කර ජල වහනය දියුණුකර අඩියක් පමණ ගැඹුරට පස පෙරලා සියුම්ව සකසා අගල් 6 8 උස තවාන් පාත්ති සකසා ගන්න. මෙහි තවාන් මාධ්‍ය ලෙස මතපිට පස් හා කොම්පොස්ට 1 : 1 ලෙස ගත් මශුණයකින් අගල් 2ක් උසකට තවාන මතුපිට අතුරාගන්න.

මෙලෙස සකසාගත් තවානේ පේලි අතර පරතරය අගල් 4ක් වන පරදි ඇලි සලකුණු කර එම ඇලි අතර බීජ තැන්පත් කර සියුම් පස් තට්ටුවකින් වසා වසුනක් දමා ආවරනය කල යුතුය. බීජ පැලවීම සමග වසුන ඉවත්කර පැල වලට වර්ධනය වීමට ඉඩ ලබාදේ. තවානෙන් පැල ගලවාගන්නා කාලය බීජ වර්ගය අනුව වෙනස් වන අතර නිරෝගී පෑෂ්ටිමත් කදක් සහිත පත්‍ර 5ක් 6ක් සහිත පැල සිටුවීමට නිර්දේශ කරයි.

## සරල බඳුන් වගාව



නිවසෙන් ඉවත ලන හිස් කිරිපිටි උර, කිරි කප්, පොලිතීන් උර වඩාත් සුදුසු වේ. වැඩි ජලය බැස යාමට පතුල සිදුරු කිරීම අනිවාර්ය වන අතර මතුපිට පස් හා කොම්පෝස්ට් 1:1 අනුපාතයට ලෙස ගත් මිශුණයකින් බදුන පුරවා ගන්න. පුරවාගත් බදුනට බිජ තැන්පත් කර සියුම් පස් තටටුවකින් බිජ වසා දමන්න. දිනපතා ජල සම්පාදනය කර බිජ පැලවීම සමග පැල ක්‍රමවත්ව හිරුඑළියට යොමුකල යුතුය. තවානෙන් පැල ගලවාගන්නා කාලය බජ වර්ගය අනුව වෙනස්වන අතර නිරෝගී පෑෂ්ටිමත් කදන් සහිත පත්‍ර 5ක් 6ක් සහිත පැල සිටුවීමට නිර්දේශ කරයි.

| බෝගය | තක්කාලි | සලාද | වම්බටු | මිරිස් | මාලු මිරිස් | ගෝවා | නෝකෝල් | ලික්ස් |
|---|---|---|---|---|---|---|---|---|
| තවාන් කාලය සති | 2 | 2 | 3-4 | 3-4 | 3-4 | 3-4 | 3-4 | 8-10 |

## නාගරික ගෙවතු වගාව

### යොදාගත හැකි බදුන්

මේ සදහා නිවසෙන් ඉවතලන හෝ මිළදී ගනු ලබන පහත ආකාරයේ භාජන යොදාගත හැක.

මල් පෝච්ච, වගා මලු, මැටි හා ජලාස්ටික් කිරි හට්ටි, හාල් මලු, ප්ලාස්ටික් භාජන, වැහි පිලි, මෙගා බෝතල් ආදිය.



## වගා මාධ්‍ය සාදා ගැනීම

මතුපිට පස්, කොම්පෝස්ට් සම අනුපාත වලින් ගෙන හොදින් මිශ්‍ර කර වගා මාධ්‍ය සාදාගනී. සාදාගත් වගා මාධ්‍යයේ ඇලෙන සුලු බව / මැටි ගතිය වැඩි අවස්ථාවලදී ජලය බැසයාම දුර්වල වන බැවින් වැලි කොටස් 1/4ක් පමණ එක්කර වගා මාධ්‍ය සමග මිශ්‍ර කර ගන්න.

බදුන් වල හොදින් ජල වහනයට වගා බදුන්වලට යොදන ජලය වගා මාධ්‍ය හරහා පහසුවෙන් බැසයාම සදහා බාජනයේ පතුල සිදුරු කිරිම වැදගත් වන අතර පසුව එම බදුනේ පතුලට බොරලු හෝ කුඩා ගඩොල් කැබලි දැමීමෙන් එම සිදුරු වැසීම වලක්වා ගත හැක.





## බෝග සදහා සුදුසු බදුන්

මුකුණුවැන්න, ගොටු කොළ  මුල මණ්ඩලය අඩු බැවින් අඟල් 4 - 6 දක්වා ගැඹුර සහිත බදුන් සුදුසු වේ. මිරිස්, ගෝවා, අතු ගෝවා, රාබු, කැරට්, බටු, නිවිති, තක්කාලි මුල මණ්ඩලය හා ශාකයේ වර්ධනය මධ්‍ය ප්‍රමානයේ බැවින් අගල් 10-12 දක්වා ගැඹුර සහිත බදුන් සුදුසු වේ. බණ්ඩක්කා, වම්බටු, මාලු මිරිස්, ගෝවා, බෝන්චි මුල මණ්ඩලය හා ශාකයේ වර්ධනය තරමක් විශාල බැවින් අගල් 12-16 දක්වා ගැඹුර සහිත බදුන් සුදුසු වේ.



## ගෘහ අලංකරණය සදහා වගාව

මෙගා බෝතල්, එල්ලන මල් පෝච්චි, ගොටුකොළ, මුකුණුවැන්න, මින්චි, සලාද

ආදාරක මත සවි කරන ලද වැහි පිලි කංකුන්, ගස් නිවිති

වගා කුලුණු කොළ එළවලු, මිරිස්, ගෝවා, තක්කාලි, නිවිති

මල් පෝච්චි ගෝවා, තම්පලා වර්ග



# වම්බටු වගාව

මෙය උද්භිද විද්‍යාත්මකව Solanum melongena ලෙස හඳුන්වනු ලබන අතර අයත් වන්නේ සොලනේසි කුලයටය. පහතරට තෙත් හා වියළි කලාප වම්බටු වගාව සදහා හොදින් ගැලපේ.



### වම්බටුවල ගුණාත්මකබව

ප්‍රෝටීනල කැල්සියම්ල දළ තන්තුල වලින් පරිපූර්ණ වේ.
සීමිත ඉඩකඩ සහිත නාගරික ගෙවතතේ බදුන්ගත වගාවට හොදින් ගැලපේ.

### පස

හොදින් හිරුඑළිය ලැබෙනල ජල වහනය වන සැහැල්ලු ලෝම පස වඩාත් යෝග්‍ය වේ

### පරතරය සහ බීජ සිටුවීම

ස්ථිර කෙෂ්ත්‍රයේදී පේලි හා පැල අතර සෙ.මී. 90 ං 60  පරතරයට එක් වලක එක් පැලයක් සිටුවයි.

### පොහොර යෙදීම

සිටුවීමට දින 2කට පෙර වලකට කාබනික පොහොර පොල්කටු දෙකක්ද ( ග්‍රෑම්500 ), පසුව සෑම සති 4කට වරක් පුරවන ලද පොල්කටු එක බැගින්ද පැලයට යොදයි.

### නිර්දේශිත ප්‍රභේද

**පාදාගොඩ** - ලා දම් පසුබිමේ සුදු පැහැය සහිත කරලකි. වඩාත් ඉහල අස්වැන්නක් ලබාදෙන අතර බැක්ටීරියා හිටුමැරීම රෝගයට ඔරොත්තුදේ.

**SM 164** - ලා දම්පැහැ කරලකිග බැක්ටීරියා හිටුමැරීම රෝගයට ඔරොත්තුදේ.

**අන්ජලී** - දෙමුහුම් ප්‍රභේදයකි. වැඩි අස්වැන්නක් ලබාදෙන අතර කරල තද දම්පැහැතිය.

### රෝග හා පලිබෝධ

**බැක්ටීරියා හිටුමැරීම** - ප්‍රතිරෝද ප්‍රභේද වගාකිරීම, බෝග මාරුව සිදුකිරීම  නිර්දේශ කරයි.

**කරටි හා ගෙඩි විදින්නා** - වම්බටු වගාවේ කරල්වලට හා කඳට හානි කරන කෘමියෙකි. ආලෝක උගුල් සවිකිරීම හා ආසාදිත ශාක කොටස්  ඉවත්කිරීම පාලනයට නිර්දේශ කරයි.

### අස්වැන්න නෙලීම

සිටුවා සති 10 - 12 අතර පළමු අස්වැන්නද පසුව දින 7කට වරක් ලෙස අස්වැන්න නෙලීම සිදුකරයි.

වටවල වවන්න
තේ රට පුරා පැළකරන අදහසක්

## ජීව රාමු ක්‍රමය

ගිණිසීරියා / ඇල්බීසියා ආදි ඉක්මනින් පැලවන ඉනි අගල් 6 පරතරයට රවුමට පිටතට ආනතියක් සහිතව සිටුවා ඉනි එකිනෙක හොදින් සම්බන්ධ වන පරිදි ලනු/ උණපට/ පුවක්පට යොදා ගැට ගසනු ලැබේ.
පහසුවෙන් දිරායන ගෙවත්තෙන් ඉවතලන ශාක ප්‍රත්‍ර මෙයට එක්කර දිරායාමට සලස්වයි. මෙම රාමුවේ යට කොම්පෝස්ට් ලබාගත හැකි වන ලෙස සකසාගත් කවුලුවක් තිබිය යුතුය. මාස 4කින් පමණ කොම්පොස්ට් ලබාගත හැක.

## ෆිෂ් ටොනික් (මාලු දියර පොහොර)

ෆිෂ් ටොනික් යනු නිවසෙන් ඉවතලන මාලූ අපද්‍රව්‍ය යොදා ගනිමින් සාදා ගනු ලබන කාබනික පොහොරකි. වැසිය හැකි ජලාස්ටික් බදුනකට මාලූ අපදුව්‍ය කිලෝ 1කට දුඹුරු සීනි ග්‍රෑම් 500 දමා හොදින් කවලම් කර අමුද්‍රව්‍ය පෙඟෙන ප්‍රමාණයට ජලය එක්කර පියන වසාතබයි. දින 14කට පසු නැවත දුඹුරු සිනි ග්‍රෑම් 500ක් මශ්‍රනයට එක්කර අමුදුව්‍ය පෙඟෙන ප්‍රමාණයට ජලය එක්කර පියන වසන්න. එදින සිට දින 14කින් ෆිෂ් ටොනික් මාලූ දියර පොහොර ලබාගත හැක.



## ෆෲට් ටොනික් (පළතරු දියර පොහොර)

ෆෲට් ටොනික් යනු නිවයෙන් ඉවතලන පළතුරු කොටස් යොදා ගනිමින් සාදා ගනු ලබන කාබනික පොහොරකි. වැසිය හැකි ප්ලාස්ටික් බදුනකට කුඩා කැබලි වලට කපන ලද පළතුරු කිලෝ 3කට දුඹුරු සිනි කිලෝ 3 දමා පසුව ජලය ලීටර් 3ක් එක්කර ගොදින් කවලම් කර දින 45ක් වසා තබන්න. දින 45කට පසු ෆෲට් ටොනික් පළතුරු දියර පොගොර ලබාගත ගැක.

පැල සිටුවීමට පෙර කොම්පොස්ට් වගා මාධ්‍යය හා හොදින් මිශ්‍ර කර ගත යුතය. පැල වර්ධනය වූ පසු සති 2කට වරක් කාබනික දියර පොහොර යෙදිම කල යුතුය.





## පැල තවාන

ස්ථිර ක්ෂේත්‍රයේ හිටුවිමට පෙර බීජ හා පැල තාවකාලිකව සංස්ථාපනය කර වර්ධනය කරගන්නා ස්ථානයකි.



# කැරට් වගාව

උද්භිද විද්‍යාත්මකව Daucus carota ලෙස හඳුන්වනු ලබන කැරට් අයත්වනුයේ Umbelliferae කුලයටයි. උඩරට තෙත් හා වියළි කලාපීය පරිසර තත්ත්ව යෝග්‍යවේ.



### කැරට් වල පෝෂණ ගුණය

ප්‍රෝටීනල කාබොහයිඩ්‍රේට්ල විටමින් ඒ, කේ, කැල්සියම්, පොස්පරස් බහුලයි. ඇස් පෙනීම වර්ධනය, සිරුරේ බර අඩු කිරීම, පිලිකා සෛල මර්ධනය වැනි ගුණාංග සහිත එළවලුවකි.
ළපටි දළු සලාදයක් ලෙස ආහාරයට ගත හැකි පෝෂදායි පලා වර්ගයකි.

### පස

ගල් බොරලු වලින් තොර, කාබනික ද්‍රව්‍ය අඩංගු වැලි සහිත ලෝම පස වඩාත් යෝග්‍ය වේ.

### පරතරය සහ බීජ සිටුවීම

සෙ.මී. 30  ගැඹුරට පෙරළාගත් පස හොදින් කැට පොඩිකර ගෙන හොඳින් වතුර බැස යන පරිදි මීටරයක් පලලට සෑදු උස් පාත්ති වල සෙ.මී. 25  පළලට සැකසූ පේලි දිගේ බීජ දමන්න. බීජ පැලවී සති 4 -5 දී පැල අතර පරතරය සෙ.මී. 5  වන ලෙස වැඩි පැළ ගලවන්න.

### පොහොර යෙදීම

බීජ යෙදීමට දින දෙකකට පෙර සැකසූ පාත්ති වලට කාබනික පොහොර හොඳින් මිශ්‍ර කරන්න. පසුව සෑම සති 3- 4 කට වරක් පේලි අතරට කාබනික පොහොර යොදා පැල මුලට පස් ලං කරන්න.

### නිර්දේශිත ප්‍රභේද

**නිව් කුරෝඩා -**
තද තැඹිලි පැහැ  සිලින්ඩරාකාර හැඩති අලයකි. වැඩි අස්වැන්නක් ලබාදෙන ගොවීන් අතර ජනප්‍රිය ප්‍රභේදයකි.
**ලංකා කැරට් -**
පූර්ව අංගමාරයට ප්‍රතිරෝධී, අධික වර්ෂා කාලයේදී වගා කළ හැකි  ප්‍රභේදයකි. කෝණාකාර හැඩති අලය කහ තැඹිලි පැහැ ගනියි.

### රෝග හා පලිබෝධ

**ප්‍රත්‍ර අංගමාරය /මෘදු කුණුවීම**
වැසි සමය මගහැර වගා කිරීම, වගාවේ ජලවහනය දියුණු කිරීම, පැල අතර නිසි පරතරය තබා ගැනීම තුළින් මෙම රෝග පැතිරීම පාලනයවේ.

### අස්වැන්න නෙලීම

දින 85 - 100  පමණ වන විට අස්වැනු නෙලාගත හැක.



වටවල
වවන්න
තේ
රට පුරා පැළකරන අදහසක්

වටවල

තේ

වම්බටු

වටවල වවන්න

තේ රට පුරා පැළකරන අදහසක්